# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1949/41 - 2016 ජනවාරි මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2016.01.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාව යටතේ පත්කරන ලද සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයාට පැවරෙන කාර්යයන් හා කර්තව්‍යයන් 2016 ජනවාරි මස 01 වැනි දින සිට පහත උපලේඛනයේ සඳහන් වන පරිදි ක්‍රියාත්මක විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45(2) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව ම විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජෝන් ඊ. ඒ. අමරතුංග, පා.ම.
සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය.

2016 ජනවාරි මස 06 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

*සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. අමාත්‍යවරයාගේ උපදෙස් මත සංචාරක ප්‍රවර්ධන කටයුතුවලට අදාළ ව්‍යාපෘති/වැඩසටහන් සම්පාදනය, පසුවිපරම් කිරීම් හා ඇගයීම.
2. දිවයින පුරා සංචාරක ක්ෂේත්‍රයට අදාළ කටයුතුවල නීත්‍යානුකූලව නියැලී සිටින අවිධිමත් අංශයේ ආයතන හා පුද්ගලයන් සඳහා යෝජිත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ සාර්ථකත්වය තහවුරු කිරීම. (උදා. හෝටල්, අවන්හල්, බීමහල්, මාර්ගෝපදේශකයන්, චාරිකා ඒජන්තවරුන් ආදිය). එබැවින් 2016 ජුනි වන විට ඒවා විධිමත් ආයතන බවට පත්විය යුතු අතර, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමග එක්ව මෙම ක්‍රියාවලිය මෙහෙයවීම සිදු කිරීම.
3. දේශීය සංචාරක ප්‍රවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය අධීක්ෂණය සහ පසු විපරම් කිරීම.
4. ක්‍රිස්තියානි ආගමික කටයුතුවලට අදාළ ප්‍රාදේශීය වැඩසටහන් සම්පාදනය, පසුවිපරම් කිරීම සහ ප්‍රගතිය සමාලෝචනය කිරීම.
5. සංචාරක හෝටල් සංවර්ධනය සහ නියාමනය හා හෝටල් වර්ගීකරණයට අදාළ සියළුම කටයුතු.
6. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කටයුතු සමාලෝචනය, පසු විපරම් කිරීම හා ඇගයීම සඳහා එම ආයතනය සමග සමීප සම්බන්ධතා පවත්වාගැනීමට හා කටයුතුවල ඵලදායීතාවය තහවුරු කිරීම.
7. සංචාරක ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය මානව සම්පත් සංවර්ධනයට අදාළ කාර්යයන්.
8. අමාත්‍යවරයා විසින් කලින් කලට පැවරිය හැකි වෙනත් කාර්යයන් හෝ කර්තව්‍යයන්.

01 - 1097

1A - G 2789 — 456 (2016/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*